**2019 ජූනි මස 03 වන දින සිට 2019 ජූනි මස 09 වන දින දක්වා**

**ප්‍රශංසා එකතු සුපුවත**

**අබ්බා තාත්තා ! අබ්බා අම්මා! ජේසු සමිඳාණන් වහන්සේගේ**

**ජීවිත තේමාව වූවා නිසැකයි**

01. ආරම්භක ප්‍රශංසාව : පුබුදු ගී අංක 05 "ශ්‍රද්ධාන වීර්ය...."

02. ප්‍රශංසාවට යොමුව :

**"මන්ද ඔබ ලබා ඇත්තේ නැවතත් බිය ගෙන දෙන වහල් සේවයේ තත්ත්වය නොව, "අබ්බා පියාණෙනි"යි අමතා යාච්ඤා කිරීමට ඉඩ ඇති පුත්‍රකම ලැබීමේ තත්ත්වයකි."** (රෝම 8:15)

2019 වසර පුබුදු ජනතාව වූ ඔබට/ මට මොනතරම් සුවිශේෂී ද? කිසිවෙකුට හිමි නොවන භාග්‍යවන්ත අත්දැකීමකට මේ වසර තුළ සමිඳාණන් වහන්සේ ඔබව / මාව රැගෙන ආවා නොවේද? මුළු විශ්වය මවා පාලනය කරන සර්වබලධාරී දෙවියන් වහන්සේට අබ්බා තාත්තේ කියන්නට අබ්බා අම්මේ කියන්නට අප ලද ආශිර්වාදය මොනතරම් බලගතු ද? අපි නොසිතූ අත්දැකීමක් ඔස්සේ ගමන් කරන්නට සලස්වමින් දෙවියන් වහන්සේගේ පිතෘක මාතෘක රැකවරණය අප සමඟ බව අත්දකින්නට අපි සැමට ලැබුනු සියළුම අත්දැකීම් මුල් කරගෙන ප්‍රශංසාවට ඇතුළු වෙමු.
පුබුදු ගී අංක 150 "ඔබෙන් තොරව ...."

03. ආපසු බැලීම :

* රටක් ලෙස අප මුහුණ දුන් අත්දැකීම සමඟින් 2019 වසරේ ශුද්ධාත්ම ආගමන මංගල මහෝත්සවය පවත්වන්නට අපට සිදුවූයේ අපේම ශ්‍රාවක සංඝයන් තුළයි. සාංඝික පවුල් දිනය මෙවර අපගේ ශුද්ධාත්ම මංගල්‍යය පවත්වන ස්ථානය විය. එදින ඔබ ලැබූ අත්දැකීම බෙදා ගන්න....

04. දවසේ සුපුවත: **අබ්බා තාත්තා ! අබ්බා අම්මා ! ජේසු සමිඳාණන් වහන්සේගේ ජීවිත තේමාව වූවා නිසැකයි**

* අද දවසේ අපි අපේ අවධානය යොමු කරනුයේ අබ්බා තාත්තා ලෙස දෙවියන් වහන්සේව අත්දුටු ජේසු සමිඳාණන් වෙතටයි.
* දෙවියන් වහන්සේට අබ්බා තාත්තේ කියා ආමන්ත්‍රණය කළ හැක්කේ පුත්‍රයාණන් වහන්සේට පමණයි. ඔවුන් වහන්සේගේ මුළු ජීවිතය තුළම දෙවියන් වහන්සේට අබ්බා තාත්තේ යැයි ඇමතූ අවස්ථාවන් ශු. බයිබලය තුළ අපට දැකගත හැකිය. පිය පුතු සබැඳියාව, කුළුපගතාවය, සමීප ඇසුර මිත්‍ර සම්බන්ධතාවය පියකු තම පුතුට සිය ජීවිතයම දානය කරන බව අපට උගන්වයි. ජේසු සමිඳාණෝ පියාණන් වහන්සේගෙන්ම පිරී සිටි සේක. තමන් වහන්සේගේ ජීවිතයට පියාණන් වහන්සේ කොතරම් වැදගත් වූවාද කිවහොත් ඔවුන් වහන්සේ ජනිත කළ, ජීවිතයට පටන් ගැන්මක් දුන් තැනැන් වහන්සේ අබ්බා තාත්තා බව ඔවුන් වහන්සේගේ අත්දැකීමයි.

උදා: ශු.මතෙව් 23:9 **"මිහිපිට කිසිවෙකුට 'පියාණෝ ' යි නොකියන්න. ඔබට ඇත්තේ ස්වර්ගයෙහි වැඩ වසන එකම පියාණන් වහන්සේය."**

ශු.ලූක් 2:48-49 **" දෙමව්පියෝ උන්වහන්සේ දුටු කල මවිත වූහ. උන්වහන්සේගේ මෑණියෝ 'පුතා කුමක් නිසා අපට මෙසේ කෙළෙහිද? බලන්න ඔබේ පියාද, මමද දුකින් තැවි තැවී ඔබ සෙව්වමු'යි කීහ. එවිට උන්වහන්සේ පිළිතුරු දෙමින්, 'ඔබ මා සෙව්වේ මන්ද? මාගේ පියාණන්ගේ මැඳුරෙහි මා සිටිය යුතු බව ඔබ නොදන්නහුදැ'යි ඔවුන්ට වදාළ සේක."**

මනුෂ්‍ය මව පියා සිටියද අබ්බා තාත්තා මගේම පියාණන් බව ඔවුන් වහන්සේ අත්දුටු සේක.

ගීතාවලිය 2:7 **.... එතුමාණෝ මට කථා කොට, "නුඹ මාගේ පුත් කුමරුය, අද මම ඔබේ පිය රජ වූයෙමි. "**

* ජේසු සමිඳාණන්ගේ අරමුණ, දැක්ම, ජීවිතය පියාණන් වහන්සේගේ කැමැත්ත ඉටු කිරීම සඳහා ය. ඔවුන් වහන්සේ තුළින් සිදු වූ ක්‍රියාකාරිත්වයන් තාත්තා තුළින් උරා ගත් ක්‍රියාකාරිත්වයක්ම විය.
* ඔවුන් වහන්සේ කෙනෙක් දිහා බැලුවේ ද, සිද්ධියක් දෙස බැලුවේ ද පියාණන් වහන්සේගේ දෙනෙතින් ය.
* කෙනෙකුට ප්‍රේම කළේද පියාණන් වහන්සේගේ හදවතින් ය.
* කෙනෙකුට සමාව දුන්නේ ද කොන්දේසි විරහිතව, කරුණාබරිත පියාණන් වහන්සේගෙන් නික්මුණු සමාව දීමේ ප්‍රේමයෙන් ය.
* කෙනෙකුට සවන් දුන්නේ ද පියාණන් වහන්සේගේ දෙසවනින් ය.

උදා: ශු.ජොහාන් 4:34 **"මාගේ භෝජනය නම්, මා එවූ තැනැන් වහන්සේගේ කැමැත්ත කිරීමත්, උන්වහන්සේගේ කාර්යය නිමාවට පත් කිරීමත් ය."**

ශු.ජොහාන් 5:17 **"මාගේ පියාණන් වහන්සේ නොනැවතීම වැඩ කරන සේක; මමත් වැඩ කරමි"යි වදාළ සේක.**

ශු.ජොහාන් 5: 19-23

පියාණන් වහන්සේ යමක් කරනවා පුත්‍රයා දකින්නේ ද ඒ දෙය මිස තනිව කිසිවක් කරන්නට උන්වහන්සේට නොහැකි ය. මන්ද පියාණන් වහන්සේ යම් දෙයක් කරන සේක්ද පුත්‍රයාණන් එසේම කරන සේක.

05. අප දෙසට :

* ආදරවන්ත පියෙකු තුළ යැපෙන විශ්වාසවන්ත පුතෙකු ලෙස ක්‍රිස්තුන් වහන්සේ පියාණන් ලෙස දෙවියන් වහන්සේට කථා කළා පමණක් නොව, ඔවුන් වහන්සේ කළාවූ සියළුම ක්‍රියාවන් තුළින් අබ්බා පියාණන් වහන්සේව ප්‍රකාශ කළ සේක.
* ක්‍රිස්තුන් වහන්සේ තුළ දේව පුත්‍රභාවයට කැඳවනු ලැබූ ඔබ / මා පුත්‍රභාවයේ උරුමය අත්දකිමින් අබ්බා තාත්තේ කියා දෙවියන් වහන්සේට ආමන්ත්‍රණය කරනවා ද?
* මා තුළින් අබ්බා පියාණන් වහන්සේව ප්‍රකාශ වෙන්නට ඉඩ හරිනවා ද?

06. අවසාන ප්‍රශංසාව :

පුබුදු ගී අංක 140 "මිහි දෙරණේ මා ...."

==========================

## 2019 ජූනි මස 10 වන දින සිට 2019 ජූනි මස 16 වන දින දක්වා ප්‍රශංසා එකතු සුපුවත

### මහෝත්තමයාණන්ගේ පිතෘක මාතෘක ප්‍රේමය දේව දරුවන්ගේ දිව්‍යමය භෝජනයයි

01. ප්‍රශංසාව සඳහා යොමුව:

* අබ්බා තාත්තේ ! අබ්බා අම්මේ ! ඔබ වහන්සේගේ පිතෘක මාතෘක ආදරය දිව්‍යමය භෝජනයකි. සකල ආශිර්වාදයකි. ඔබ වහන්සේ ඉදිරියේ ප්‍රේමයෙන් ශුද්ධව නොකැලැල්ව සිටින පිණිස ලෝකය මැවීමට ප්‍රථමයෙන් අප තෝරා ගත් සේක. දැනටමත් අප ලබා ඇති පුත්‍රකම සකල ආශිර්වාදය වෙනුවෙන් ඔබ වහන්සේට තුති පුදමු.
* ස්වර්ගයේ වැඩ සිටින අපගේ පියාණෙනි ඔබගේ ශ්‍රී නාමය ප්‍රශංසා වේවා !
* පුබුදු ගී අංක 140 " මිහි දෙරණේ මා..."

02. පසුගිය සුපුවත නැවත මෙනෙහි කර ගනිමින් අත්දැකීම් බෙදා ගනිමු.

03. සතියේ සුපුවත :

(අ) දිව්‍යමය ප්‍රේමයේ සුවිශේෂ වූ ප්‍රකාශනය දේව පුත්‍රයාණන් වන ජේසුස් ක්‍රිස්තුන් වහන්සේ ය. ඔවුන් වහන්සේ සදාතනිකවූ ද ජීවනදායකවූ ද දිව්‍යමය ආහාරයයි. ශුද්ධවූ භෝජනයයි. මහෝත්තමයාණන්ගේ පිතෘක හා මාතෘක ප්‍රේමයේ ආහාරය වන, භෝජනය වන සමිඳාණන් වෙත අපගේ නෙත්, සිත්, හදවත් යොමු කරමු.

(ආ) මෙහි පහත දැක්වෙන ශුද්ධ ලියවිලි පාඨ කියවා කුඩා කණ්ඩායම්වල මෙනෙහි කරමින් ක්‍රිස්තුන් වහන්සේ අපට ද දිව්‍යමය භෝජනය වන අයුරු ද, පිතෘක මාතෘක ප්‍රේමයේ ස්වභාවය ගැන ද බෙදා ගනිමු.
i ශු.ජොහාන් 6:26-30 ii ශු.ජොහාන් 6:32-35

(ඇ) ක්‍රිස්තුන් වහන්සේ දේව කැමැත්තයි. උන්වහන්සේ මනුෂ්‍ය ආකාරයෙන් අප අතර වැඩ සිටිමින් දේව කැමැත්ත මුළුමනින් ඉටු කළ අයුරු ද, පිතෘක මාතෘක ආදරය අත්දුටු අයුරු ද මෙනෙහි කරමු.
iii ශු.ජොහාන් 6:38-44

(ඈ) මහෝත්තමයාණන්ගේ පිතෘක ආදරය අත්විඳින ඉතා සුවිශේෂ වූ දිව්‍ය භෝජනය දිව්‍ය සත්ප්‍රසාද වහන්සේ ය. ක්‍රිස්තුන් වහන්සේ එවැන්නක් අපට අනාවරණය කළ සේක.
iv ශු.ජොහාන් 6:47-51 v ශු.ජොහාන් 6:54-58

04. අපගේ පුත්‍රභාවය දෙස බලමු.
* අපි සැබවින්ම ක්‍රිස්තුන් වහන්සේව සොයන්නේ ... එදිනෙදා ජීවිතයේ ලබන්නාවූ අපගේ අවශ්‍යතා සඳහා ද? එසේ නැතහොත් උන්වහන්සේ මගින් දේව ආදරය අත් විඳිනු සඳහා ද?
* අබ්බා පියාණන්ගේ අබ්බා මෑණියන්ගේ ශුද්ධවූ කැමැත්ත ඉටු කිරීමෙන්, ඔවුන් වහන්සේගේ ශුද්ධවූ කැමැත්ත අප ජීවිත තුළ ඉටු කිරීමට ඉඩ දීම ඉමහත් ආශිර්වාදයක් බව අප මුළු සිතින් අවබෝධ කරගෙන තිබේ ද?
* දිව්‍ය සත්ප්‍රසාදීය භෝජනය අපට සදාකාල ජීවිතය භුක්ති විඳීමට ඉතා සුවිශේෂ වූ මාර්ගය නම්, කෙතරම් පිපාසයක් අප හදවත් තුළ තිබිය යුතු ද? උන්වහන්සේව ලබා ගන්නට, අන් අයට මේ සුභාරංචිය ප්‍රකාශ කරන්නට.

05. ප්‍රායෝගික වීම සඳහා :
* දෙවියන් වහන්සේ අපට දී තිබෙන පරම නිධානය පුත්‍රභාවයයි.එසේ නම් දේව පුතෙකු දුවෙකු සේ නිර්භීත ලෙස අබ්බා තාත්තේ ! අබ්බා අම්මේ ! කියා ආමන්ත්‍රණය කරමු.සැබවින්ම ඔවුන් වහන්සේ අප කෙරෙහි ප්‍රසන්න වනු ඇත. දේව දරුවන් වන අප දිව්‍යමය ආහාරයෙන් මවක මෙන් පෝෂණය කරනු ඇත. ප්‍රේමයෙන් අප නහවනු ඇත. පවිත්‍ර කරනු ඇත.
* දේව කැමැත්ත නම් ජේසුස් ක්‍රිස්තුන් වහන්සේට සියල්ලේදී ප්‍රමුඛතාවය දීමයි. ස්වාමිත්වයට අපි නතු වීමයි. එමගින් දිව්‍යමය ප්‍රේමයේ ආහාරය වළඳින අපි සදාතනික ජීවිතයේ උරුමය ලබන්නෙමු.
* දිව්‍යමය භෝජනය ලබමින් පිතෘක මාතෘක ආදරයට විවෘත වෙමු. අප තුළින් පවුල, සංඝය, සමාජය වෙත ආදරය ගලා යවමින් දේශය සුවපත් වීමට පියවර ගනිමු. දේශයේ ජනතාව වෙනුවෙන් මෙත් සිත් වඩමු.

06. අවසාන යාච්ඤාව :
* පිතෘක මාතෘක ප්‍රේමය කෙරෙහි අප පිපාස කරන මෙන් ඉල්ලා යාච්ඤා කරමු.
* පුබුදු ගී 365 (නව පරිවර්ථනය) 339 (පැරණි පරිවර්ථනය)
"නැතිද මට දෙන්නේ...."

************************